යම් කිසි සිදුවීමක් වාතර්‍ා කිරීමේදී, එය හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) ආකාරයෙන් වාතර්‍ා නොකිරීම වඩාත් යෝග්‍ය වේ. මන්ද යත්, හැඟීම් කළඹවන සුළු වාතර්‍ාකරණයන් ඔස්සේ, සිදුවීමක සැබවින්ම අවධානයට ලක් විය යුතු කරුණු පාඨකයාගේ අවධානයට හසු නොවීමටත්, සිදුවීම දෙස අපක්ෂපාතීව බැලීමට පාඨකයාට ඇති හැකියාව ගිලිහී යෑමටත් ඉඩ ඇති බැවිනි.

එම පසුතලය ඔස්සේ, අරුණ පුවත්පතේ ජූලි 6 සහ 7 දිනයන් හි පළ වූ සිරස්තලයන් කිහිපයක් විමසා බැලිය හැක.

*තරුණියකගේ නිරුවත FB දමනවැයි කිව්වම ගමක් ඇවිස්සිලා" - යාපනයේ අච්චුවේලි ප්‍රදේශයේ පුද්ගලයන් දෙදෙනෙකුට සහ නිවාස දෙකකට පහර දී අලාභහානි කිරීම සම්බන්ධයෙන් පිරිසක් අත්අඩංගුවට ගැනීම.

*කාසිවලට රාග සිත් නිවූ නැම්බියන් මාට්ටු - විශ්‍රාමික පොලිස් අධිකාරිවරයකුට අයත් වව්නියාවේ ගොඩනැගිල්ලක පවත්වාගෙන ගිය ලිංගික සේවා හලක් වටලා එහි සිටි ලිංගික ශ්‍රමිකයින් අත්අඩංගුවට ගැනීම.

*ආණ්ඩුව රටටම කුක්කු පොවයි: මුලින්ම ඉරුවේ ඇමැතිවරු - පශු සම්පත් සංවධර්‍න රාජ්‍ය අමාත්‍යාංශය විසින් මෙරට දියර කිරි ප්‍රචලිත කිරීම සඳහා ප්‍රංශ රජයේ ආධාර ඇතිව දිවයින පුරා කුඩා පරිමාණ කිරි නිෂ්පාදනාගාර හයක් ආරම්භ කිරීම සහ එම නිෂ්පාදනාගාර කෘෂිකමර්‍ ඇමැති මහින්ද අමරවීර, පශු සම්පත් සංවධර්‍න රාජ්‍ය ඇමැති ඩී.බී. හේරත් සහ මෙරට ප්‍රංශ රජයේ තානාපති ජීන් ප්‍රන්කොයිස් පැක්ටට් විසින් විවෘත කිරීම.

ඔබ සිතන ආකාරයට,

1) මෙවැනි සිරස්තල භාවිතයෙන් පාඨකයාට මෙම පුවත් පිලිබඳව නිවැරදිව සහ කැළඹුණු හැඟීම් වලින් තොරව, අපක්ෂපාතීව බැලීමේ හැකියාවක් ලබාදෙන්නේ ද?

2) මෙවැනි සිරස්තල හුදෙක් අවධානය ලබා ගැනීමට පමණක් යොදා ගන්නා ඒවා නොවේද? ඒ තුළින් පාඨකයා නොමග හැරීමක් සිදු නොවන්නේද?

3) එසේ නම්, මෙවැනි හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) සිරස්තලයන් භාවිතය ආචාරධාමර්‍ික මාධ්‍යකරණය ලෙසින් සැලකිය හැකිද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර්‍ කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!